මිනිසෙකු හා දේවත්වයට ආදේශ කිරීම හා දේවත්වය ප්රතික්ෂේප කිරීම අතර වෙනස සලාතය අත්හැර දැමීමය."

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශයට මම සවන් දී ඇත්තෙමි යැයි පවසා ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "මිනිසෙකු හා
දේවත්වයට ආදේශ කිරීම හා දේවත්වය ප්රතික්ෂේප කිරීම අතර වෙනස සලාතය අත්හැර
දැමීමය."
[صحيح] [رواه مسلم]

අනිවාර්යය සලාතය මඟ හැරීම ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අවවාද කළහ. සැබැවින්ම පුද්ගලයකු හා බහුදේව වාදයේ මෙන්ම දේවත්වය ප්රතික්ෂේප කිරීමේ ඇඳ වැටීම අතර පවතිනුයේ සලාතය මඟ හැරීමය. සලාතය ඉස්ලාමයේ මූලිකාංග අතරින් දෙවන මූලිකාංගයයි. ඉස්ලාමයේ එහි කරුණ අති වැදගත්ය. කවරෙකු එය අනිවාර්යභාවය ප්රතික්ෂේප කරමින් එය අත්හැරියේ ද මුස්ලිම්ලිම්වරුන්ගේ සම්මුතියට අනුව ඔහු ප්රතික්ෂේප කළ අයකු මෙන් වේ. මැලිකමින් හා නොසැලකිලිමත්කමින් කවරෙකු එය අත්හැරියේ ද ඔහු දේවත්වය ප්රතික්ෂේප කළ අයකු වේ. ඒ සම්බන්ධයෙන් සහාබාවරුන්ගේ සම්මුතියන් සඳහන් වී ඇත. ඇතැම් අවස්ථාවල එය ඉටු කර තවත් අවස්ථාවල එය මඟ හරින්නේ නම් ඔහු ද මෙම දැඩි අවවාදයට යොමු කරනු ලබන්නෙකි.

https://sunnah.global/hadeeth/si/show/65093